Operation Sovereign Borders

# මාධ්‍ය නිවේදනය

**13 නොවැම්බර් 2016**

## ඕස්ට්‍රේලියානු දේශසීමා අන් කවරදාටත් වඩා ශක්තිමත්ය

ඕස්ට්‍රේලියාව වෙත පැමිණෙන මිනිස් ජාවාරම්කාර බෝට්ටු නැවැත්වීම සම්බන්ධයෙන් දේශසීමා ස්වාධිපත්‍ය මෙහෙයුමේ (Operation Sovereign Borders - OSB) සාර්ථකත්වය මගින් පැහැදිලිවන්නේ අපගේ දේශසීමා අන් කවරදාටත් වඩා දැන් ශක්තිමත් බවයි.

අපගේ නාවික වත්කම් සහ නිරීක්ෂණ පහසුකම් සම්බන්ධයෙන් මෑතකාලීනව කල වැඩිදියුණු කිරීම් මගින් අනාගතයේදී ඕස්ට්‍රේලියාවට පැමිණීමට උත්සාහ ගන්නා ඕනෑම බෝට්ටුවක් මගදී අල්ලාගෙන නැවත හරවා යැවීම සහතික කරනු ඇත.

OSB ආරම්භ කිරීමෙන් අනතුරුව මිනිස් ජාවාරම් කල යාත්‍රා 29කින් පැමිණි 740 දෙනෙකුට වැඩි පිරිසක් මගදී අල්ලාගෙන ඔවුන් පැමිණි රටට නැවත හරවා යවා ඇත.

සරණාගතයන් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් (United Nations High Commissioner for Refugees (UNHCR)) මගින් අනුමත කල නාවුරු සහ පැපුවා නිව් ගිනි හි සිටින සරණාගතයන්, දැනට පවතින එක්සත් ජනපදයේ සරණාගතයන් පිළිගැනීමේ වැඩසටහන (United States Refugee Admissions Program) යටතේ නැවත පදිංචි කිරීම සම්බන්ධයෙන් සලකා බැලීමට යොමු කිරීමට එක්සත් ජනපදය එකගවී ඇති බවට අද ඕස්ට්‍රේලියානු රජය නිවේදනයක් නිකුත් කරන ලදී.

මූලික අවධානය කාන්තාවන්, දරුවන් සහ පවුල් වෙත යොමු කරමින් වැඩිපුරම අවධානමක් දරණ සරණාගතයන් නැවත පදිංචි කිරීමට ප්‍රමුඛතාවය ලබාදේ.

මෙය දැනට පවතින පැපුවා නිව් ගිනි සහ කාම්බෝජය සමග ඇති ස්ථිර ලෙස නැවත පදිංචි කිරීමේ වැඩපිළිවෙලට අමතරවය.

මෙම වැඩපිළිවෙල අනාගතයේදී නීතිවිරෝධී ලෙස ඕස්ට්‍රේලියාව වෙත පැමිණීමට උත්සාහ කරන කිසිවෙකු හට අදාල නොවන, නැවත කිසිදිනක සිදු නොවන, එක් වරක් පමණක් සිදුවන වැඩපිළිවෙලකි.

ඕස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්තිය කිසි ලෙසකින් වෙනස්වී නොමැත. බෝට්ටු මගින් මිනිසුන් පැමිණි රටට ඔවුන්ව නැවත හරවා යැවීම තව දුරටත් සිදු කරන අතර ප්‍රාදේශීය පිරිසැකසුම් මධ්‍යස්ථාන භාවිතා කිරීම නුදුරු අනාගතයේදී තව දුරටත් සිදු කරනු ඇත.

නීතිවිරෝධී ආකාරයට බෝට්ටුවෙන් ඕස්ට්‍රේලියාව වෙත පැමිණීමට උත්සාහ කරන කිසිවෙකු හට මෙහි පදිංචිවීම කිසිදිනක විකල්පයක් නොවනු ඇත.

අප විසින් අපගේ දේශසීමා දැඩිලෙස ආරක්ෂාකර ඇති හේතුවෙන් අනාගතයේදී ඕස්ට්‍රේලියාවට පැමිණීමට ගන්නා උත්සාහයන් අසාර්ථක වන බැවින් රජය මගින් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන්නේ පූර්ණ විශ්වාසයකිනි.

ඕස්ට්‍රේලියානු ආරක්‍ෂණ බලකායේ (Australian Defence Force) සහාය ඇතිව ඕස්ට්‍රේලියානු දේශසීමා බලකාය (Australian Border Force) ඕස්ට්‍රේලියානු ඉතිහාසයේ ඇති ඉතාම විශාලතම සහ වැඩිම හැකියාව ඇති නාවික නිරීක්‍ෂණ සහ ප්‍රතිචාර බලඇණිය ලෙස ක්‍රියාත්මකවේ.

**මාධ්‍ය සම්බන්ධතා:** සංක්‍රමණ සහ දේශසීමා ආරක්‍ෂණ (Immigration and Border Protection) (02) 6264 2244